**#mediaethicsSL #lka #Mawbima #Lankadeepa #Lakbima #Divaina #February23**

ප්‍රවෘත්ති වාර්තාකරණයේදී නිරවද්‍යතාවය යනු ජනමාධ්‍යයක වගකීමක් මෙන්ම මූලික මාධ්‍ය ආචාර ධර්මයක්ද වෙයි. ප්‍රවෘත්තියක් ඉදිරිපත් කිරීමේදී විශ්වාසනීය මූලාශ්‍රයන් භාවිතා කළ යුතු බව, එක් මූලාශ්‍රයකින් නොසෑහී තොරතුරු සොයා යා යුතු බව මෙන්ම හැකිතාක් දුරට පුවතට ආදාළ මූලාශ්‍රයන් දැක්වීමද යහපත් බව පෙන්වා දී ඇත්තේ එබැවිනි. එසේම වැරදි අර්ථකතන සැපයීම මගින් යම් පුවතක් විකෘත කොට ඉදිරිපත් කිරීමද මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීමක් බව පැහැදිලිවම පෙන්වා දී ඇත.

අද (23) දිනයේ පුවත්පත් තුළ බ්‍රිතාන්‍යයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරිය ඉල්ලා අස්වූ බවට දක්වා තිබීම ඉහත ආචාර ධර්මයන් උල්ලංඝනය කළ අවස්ථාවන් ලෙසින් පෙන්වා දිය හැක. දිවයින, මව්බිම සහ ලංකාදීප පුවත්පත් තුළ මෙසේ වාර්තාකරණයක් දක්නට ලැබුණු අතර, දිවයින පුවත්පත එයින් තවත් එහා ගොස් ඊට සාවද්‍ය අර්ථකතනයක්ද සපයා ඇත. මේ අතරේදී ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් ඊයේ (22) දිනයේදී මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් කියා ඇත්තේ බ්‍රිතාන්‍යයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරිය ඉල්ලා අස්වන බවට වන ප්‍රචාර සාවද්‍ය බවත්, ඇය සිය ධූර කාලය පිළිබඳ ගිවිසුම මාර්තු 31 වන දින ස්වකැමැත්තෙන් අවසන් කරනු ඇති බවත්ය.

මේ අතර ලක්බිම පුවත්පත මගින් නිවැරදි ප්‍රවෘත්තිය නිවැරදි ආකාරයෙන් පළ කරන්නට කටයුතු කර ඇත.

නිල මූලාශ්‍රයන් මගින් නිවැරදි ප්‍රවෘත්තිය පෙන්වාදී තිබියදීත්, ඒ සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රවෘත්තියක් ජනගත කිරීමට ඇතැම් පුවත්පත් කටයුතු කර තිබීම සැබවින්ම කණගාටුදායක බව පමණක් අවසානයට සටහන් කර තබමු.